(ඌ) ආබාධිත තරුණයන්හට ඔවුන්ගේ පෞරුෂත්වය වර්ධනය කර ගැනීම සඳහා ආධාර කිරීමට ;

(එ) දුම්කොළ, මද්‍යසාර සහ මත්ද්‍රව්‍යවලින් තොර සමාජයක් ප්‍රවර්ධනය කිරීම සඳහා තරුණයන්හට දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙයවීම සහ එමගින් සෞඛ්‍ය සම්පන්න, විනයවත්, දේශානුරාගයෙන් සහ මානව දයාවෙන් යුත්, පරම්පරාවක් බිහි කිරීමට ;

(ඒ) ජලය, නිවාස සහ මාර්ග වැනි යටිතල පහසුකම් හිඟවීමේ හේතුව මත තරුණයන් මුහුණපාන ගැටළු පිළිබඳව ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල ජීවත්වන තරුණයන් සමඟ සාකච්ඡා කිරීම සඳහා වැඩසටහන් මෙහෙයවීමට සහ එවැනි අවශ්‍යතා සහිත තරුණයන් සඳහා පහසුකම් සැපයීමට ;

(ඔ) යටිතල පහසුකම් පිළිබඳ අඩු ලුහුඬුකම් සඳහා විසඳුම් සොයා ගැනීමට තරුණයන් ස්වේච්ඡා ක්‍රියාකාරකම්වල යෙදවීම සඳහා තරුණයන් සංවිධානය කිරීමට සහ මෙහෙයවීමට ;

(ඕ) දුරස්ථ සහ ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතා හඳුනාගැනීම සහ එවැනි ප්‍රදේශවල සායන සහ සෞඛ්‍ය කඳවුරු මෙහෙයවීම සහ එම සායන සහ සෞඛ්‍ය කඳවුරු මඟින් අත්‍යවශ්‍ය අයට ඖෂධ සැපයීමට ;

(ක) ශ්‍රී ලංකාව සහ වෙනත් රටවල් අතර අවබෝධය සහ මිත්‍රශීලීත්වය ගොඩනැගීමේ අරමුණින් සමාන අරමුණු ඇති අනෙකුත් අන්තර් ජාතික සංවිධාන සමග තරුණ කණ්ඩායම් හුවමාරු කිරීමට ; සහ

(ග) ශ්‍රී ලංකාව තුළ ජාතික එකඟතාවය සහ සාමය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මෙම සංවිධානය යටතේ සියලුම තරුණයන් රැස්කොට ඒකරාශී කිරීමට.

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවට — සංස්ථාවේ බලතල.

(අ) බැංකු ගිණුම් ආරම්භ කිරීමට, පවත්වාගෙන යාමට සහ වැසීමට ද ;

